රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 164

මගේ අංකය: 2/9/777(එච්).
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7. 1980 ජූනි මස 04 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානයන් වෙත.

## සනීපාරක්ෂාව සම්බන්ධයෙන් පළාත්පාලන ආයතන සුපරීක්ෂාකාරී වීමේ අවශ්‍යතාවය.

1980 මැයි 02 වන දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් තීරණය ගෙන ඇත.

"රජයේ දෙපාර්තමේන්තු සහ ආයතනවල ප්‍රධානයන් මෙන්ම රාජ්‍ය සංස්ථාවල සභාපතිවරුන්ද, එම ආයතනවල ගොඩනැගිලි, සනීපාරක්ෂක කටයුතු, පරිසරය ආදී කරුණු සම්බන්ධයෙන් එකී ආයතන පිහිටා ඇති ප්‍රදේශ අයත් පළාත්පාලන ආයතනවල අතුරු ව්‍යවස්ථා පිළිපැදීමට, වරිපනම් බදු ගෙවන්නන් ආකාරයෙන්ම තනිව බැඳී සිටිය යුතුයයි සහ යම් නීති කඩකිරීමක් සම්බන්ධයෙන්, ඔවුන් එකී පළාත්පාලන ආයතනවලට වගකිව යුතුයයි තීරණය කරන ලදී. විවිධ දෙපාර්තමේන්තු, ආයතන සහ රාජ්‍ය සංස්ථා භාර සියලුම නිලධරයන්ට මේ අනුව උපදෙස් දිය යුතුයයි ද තීරණය කරන ලදී."

02. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සියලුම සේවකයන්ගේ දැනගැනීමට සලස්වන්න.

අ.ක/ ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

වැඩබලන ආයතන අධ්‍යක්ෂ